# සිංහල බුද්ධාගමේ කතරගම දෙවියෝ

ලංකාවේ ද පිටරට ද සිටින බටහිර සමාජවිද්‍යාඥයන් සිංහල බුද්ධාගම ගැන කතාකිරීමේ දී වරද්දා ගන්නා තැන් බොහෝ ය. ඔවුන්ට පළමුකොට ම බුද්ධාගම යනු කුමක් ද යන්න පිළිබඳ ව එතරම් අවබෝධයක් නැත. ඒ බුදු දහම යන අරුතින් නො වෙයි. බුදු දහම පිළිබඳ ඔවුන් දන්නා දෙයක් නැත. විශේෂයෙන් ම ථෙරවාදය ගැන ඔවුන්ට අවබෝධයක් ඇත්තේ ම නැත. අප මෙහි දී බුද්ධාගම යනුවෙන් හඳුන්වන්නේ ආගම යන වචනය බුදු සසුන හා මිශ්‍ර වීමෙන් පසුව ඇති වී තිබෙන ප්‍රපංචය ය.

බටහිරයන් මෙරටට එමට පෙර මෙහි බුද්ධාගමක් නොතිබූ බව සැබෑ ය. එහෙත් ඉන් කියැවෙන්නේ අද බුද්ධාගම යනුවෙන් හැඳින්වෙන සියල්ල බටහිරයන්ගේ නිර්මාන හෝ ඔවුන් විසින් අපට දෙනු ලැබ ඇති දේ යන්න නො වෙයි. අද බුද්ධාගම යනුවෙන් හැඳින්වෙන බොහෝ දෑ බටහිරයන් විශේෂයෙන් ම ඉංගිරිසින් මෙරටට පැමිණීමට පෙර ද මෙහි විය. එසේ ම අද බුද්ධාගම යනුවෙන් හැඳින්වෙන්නෙහි ඇති දේව සංකල්ප ද, ඇතැමුන්, බටහිර සමාජ විද්‍යාඥයන් පමණක් නොව ගංගොඩවිල සෝම හිමියන් ඇතුළු ඇතැම් භික්ෂූන් වහන්සේ මෙන් ම ගිහි සිංහල බෞද්ධයන් ද කී හා කියන ආකාරයට මෙන් නොව, අපට හින්දූන්ගෙන් ලැබුණු දේ නො වෙයි.

බටහිර සමාජ විද්‍යාඥයන්ට නොතේරෙන කරුණක් නම් බුදු සසුන යනුවෙන් කිවහැකි ආයතනයක්, සංස්ථාවක් හෝ ප්‍රපංචයක් නොමැති බව ය. ඔවුන් දන්නේ පල්ලිය නම් සංස්ථාව ය. ආගම් පිළිබඳ ඔවුන්ගේ මතවාද (ඊනියා ප්‍රවාද, ප්‍රවාද යනු ද මතවාද මිස අන්දෙයක් නො වෙයි.) පදනම්වන්නේ මේ පල්ලි සංස්ථාව මත ය. කතෝලික පල්ලිය, ග්‍රීක ඕතොඩොක්ස් පල්ලිය පැරණි පල්ලි වන අතර, පහළොස්වැනි සියවසේ ඇරඹි බටහිර පුනරුදය නමින් හැඳින්වෙන බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙන් හා ඒ සමග ඇති වූ අනුරූප යටත්විජිතවාදයෙන් පසුව රෙපරමාදු, ඇංග්ලිකන්, මෙතෝදිස්ත ආදී පල්ලි ද මෑතක දී  ඇති වූ විවිධ මූලධර්මවාදී පල්ලි ද වෙයි. මූලධර්මවාදය නමින් අද හඳුන්වනු ලබන්නේ මෑතක දී ඇති වූ පල්ලි සමහරක් නමුත් මාටින් ලූතර්, කැල්වින් වැන්නෝ ද මූල ධර්මවාදීහු වූහ. ඒ තේරුම්ගත හැක්කේ සමස්ත බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ම තේරුම්ගැනීමෙන් ය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය එතෙක් පැවති කතෝලික චින්තනයට හා වැඩවසම් යුරෝපීය සංස්කෘතියට එරෙහිව පැන නැගුණක් විය. ආගමික වශයෙන් ගත්කල එය සමස්ත පල්ලි සංස්ථාවට ම විරුද්ධ විය. පූජකයන් යනුවෙන් අතරමැදි පිරිසක් අනවශ්‍ය යැයි නූතනත්වය කියා සිටියේ ය. ඔවුන්ට අවශ්‍ය වූයේ ක්‍රිස්තියානි මූලධර්මවලට යෑමට ය. එහෙත් මේ මූලධර්මවාදීන්ට ක්‍රියාත්මක වීමට තිබුණේ ඔවුන් දැනසිටි සංස්ථා හා ආයතන ඔස්සේ ය. දරදඬු ආයතනගත ධූරාවලික (ඉංගිරිසියෙන් හයරාකියල් යනුවෙන් හැඳින්වෙන) ව්‍යූහයක් හැරෙන්නට වෙනත් ව්‍යූහයක් බටහිරයන්ට මොනයම් ආකාරයක හෝ ක්‍රිස්තියානි චින්තනයක සිටිනතාක්, මොනතරම් ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන කතාකළ ද කිසි දිනෙක ගොඩනගාගත නො හැකි ය. එයට හේතුව ඔවුන්ගේ චින්තනය සර්වබලධාරී මැවුම්කාර දෙවියන්වහන්සේ කෙනකු වටා ගෙතී තිබීම ය. මේ සකල ජනතාවගේ පියා යන සංකල්පය අපි සකල පියා යනුවෙන් හඳුන්වමු. මෙරට කසිකබල් පශ්චාත්නූතනවාදී යැයි කියන විශ්වවිද්‍යාලයීය වයි කණ්ඩායමට මෙන්ම විශ්වවිද්‍යාලයීය නොවන ඉසෙඩ්  කණ්ඩායමට ද සිංහල බෞද්ධයනට සකල පියකු නැත්තේ ඇයි ද යන්න ඔවුන්ගේ ක්‍රිස්තියානි මතවාද ඔස්සේ තේරුම්ගැනීමට නො හැකි ය.

කතෝලික පල්ලියට එරෙහිව සටන් වැදුණු ද කැල්වින්, ලූතර් ව්‍යාපාරය කෙළවර වූයේ රෙපරමාදු පල්ලි ගොඩනැගීමෙන් ය. ඔවුන්ට පමණක් නොව බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය විසින් ම බිහිකරන ලද මාක්ස්වාදයට ද විවිධ පල්ලි ගොඩනගාගැනීමට සිදු විය. ඊනියා තුන්වැනි හා හතරවැනි ජාත්‍යන්තර මෙන් ම පළමුවැනි හා දෙවැනි ජාත්‍යන්තර ද අවසාන විග්‍රහයෙහි දී පල්ලි වෙයි. මාක්ස්, ලෙනින්, ස්ටැලින් ආදීන් පමණක් නොව ට්‍රොට්ස්කි, කස්ත්‍රෝ ආදීහු ද යම් ආකාරයක පාප්වරු වෙති. මෙරට මාක්ස්වාදී ව්‍යාපාරයෙහි මෙන් ම ඊනියා පශ්චාත්නූතනවාදයෙහි ද ඇත්තේ සකල පියාගේ පොඩි පොඩි නියෝජිතයන් වූ සුළු පියවරුන් වූ  ආච් බිෂොප්වරු ය. සිංහල බෞද්ධයන්ට පියකු නැතැයි කියමින් තම ක්‍රිස්තියානි සංස්කෘතිය තුළ චූන් වූ ඊනියා එක්ස් කණ්ඩයමට අද සුළු පියා තෝරාගැනීමේ ප්‍රශ්නයට මුහුණ දීමේ දී දෙකඩ වීමට සිදු වී ඇත්තේ සුළු පියවරු දෙදෙනකු ම තෝරා ගැනීමට සිදු වීමෙන් ය.

© Prof. Nalin De Silva

බුදු හාමුදුරුවෝ කිසිම අරුතකින් පල්ලියක් නො පිහිටුවූහ.  උන්වහන්සේ බුදු සසුනක් පිහිටුවූහ. එය ද බුදු සසුනක් මිස බුදු සසුන නො වී ය. බටහිර හා අරාබි භාෂාවල ද චර්ච් අල් හජ් ආදී වශයෙන් එකම එක යන අරුත දෙන ද හා අල් ආදී වචන තිබුණ ද සිංහලයෙහි එවැනි වචනයක් නොමැති බව මෙරට සිටින කොයි කොයි සුළු පියාත් අවබෝධකරගත යුතු ය. ද බුද්ධ සසුනක් අපට නැත. එනිසා ම අපට සිංහල බුදු සසුනක් ද, තායිලන්තයේ තායි බුදු සසුනක් ද ආදී වශයෙන් වෙයි.

අවුරුදු දෙදහස් තුන්සියයකට පමණ පෙර මෙරටට වැඩම කළ මිහිඳු මහරහතන් වහන්සේ සිංහල බුදු සසුන පිහිටුවූහ. එය කිසිසේත්ම පෘතුගීසීන් මෙරටට කතෝලික ආගම ගෙනැවිත් අප රට වතිකානුවේ කතෝලික පල්ලියේ පාප්තුමාගේ අණසකට යටත් වූ කතෝලිකයන් ඇතිකිරීම වැන්නක් නො වී ය. මිහිඳු හාමුදුරුවන් පිහිටු වූ සිංහල බුදු සසුනෙහි පියකු හෝ සුළු පියවරු හෝ නොවූහ. අපට දඹදිව සිට අණ දීමට කිසිම පියෙක් (පාප්වරයෙක්)  නො සිටියේ ය. එපමණක් නො වෙයි. මිහිඳු හිමියන් පිහිටු වූ සිංහල බුදු සසුනෙහි එවකට දඹදිව තිබූ අශෝක බුදු සසුනෙහි නැති ලක්ෂණ ද විය. අප කලින් ද සඳහන්කර ඇති බෝධි වන්දනාව ඉන් එකක් විය.

මිහිඳු හාමුදුරුවෝ තමන්වහන්සේ මෙරටට වැඩම කරන විට ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව රැගෙන නො වැඩිය හ. උන්වහන්සේ සිංහල භාෂාව ඉගෙන ගෙන මෙරටට වැඩම කර ඇති බව පැහැදිලි මුත් මෙරට දී තේරුම්ගත් කරුණු මත පදනම් වී ශ්‍රී මහා බෝධින්වහන්සේගේ ශාඛාවක් වැඩම කරවීමට කටයුතු කළහ. මෙරට බෝධි වන්දනාව යනු වෘක්ෂ වන්දනාව සංශෝධනයකර ඉදිරියට ගෙනයෑමක් විය. සිංහල බුදු සසුනට හෝ වෙනත් බුදු සසුනකට හෝ, අළුතින් යමක් ගැනීම හෝ තිබෙන දෙයක් ඉදිරියට ගෙනයෑම හෝ බාධාවක් නො වෙයි. එයට හේතුව බුදු සසුනක් පිහිටුවනු ලබන්නේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය ඔස්සේ මෙරටට යටත්විජිතවාදී ව පටවනු ලබන අංග මෙන් නොව, (මේ පැටවීමට බටහිර අනුකාරකයෝ උත්තරාරෝපණය යන වචනය යොදාගනිති. එහෙත් එහි ඇති උත්තර බවක් නැත. ඒ වචනයෙන් කෙරෙන එකම දෙය මේ පැටවීම පිටුපස ඇති යටත්විජිතවාදය සැඟවීම ය.) යම් රටක සංස්කෘතියට වෙනත් බුදු සසුනකින් යම් යම් අංග අවශෝෂණයකිරීමෙන් බැවින් ය. කතෝලික ආගම ද, ක්‍රිස්තියානි නූතනත්වය ද, ධනපති ක්‍රමය ද, මෙරට ඇති කසිකබල් අධ්‍යාපනය ද යටත්විජිතවාදීව මෙරට ඇතුල්කරනු ලැබූ අංග අතර වෙයි.

සිංහල බුදු සසුනෙහි ඇත්තේ මෙරට තිබූ වෘක්ෂ වන්දනාව පමණක් නො වෙයි. මෙරට සංස්කෘතියෙහි සිටි දෙවි දේවතාවුන් ද සිංහල බුදු සසුනෙහි දැකිය හැකි ය. කසිකබල් බටහිර සමාජවිද්‍යාඥයන් නිතර කතාකරන කතරගම දෙවියන් උදාහරණයකට ගනිමු. මේ කතරගම දෙවියන් ගැන ඊනියා සමාජ විද්‍යාඥයන් දකින්නේ සිංහල බෞද්ධයන් හින්දු ආගමෙන් ගත් දෙවි කෙනකු ලෙස ය. එහෙත් මොවුන් අමතකකරන කරුණක් නම් දුටුගැමුණු රජු දවස ද මහසෙන් නමින් දෙවිකෙනකුට කතරගම දී පුද පූජා පවත්වා ඇති බව ය. දුටුගැමුණු රජු සිංහල බෞද්ධයකු බව මේ කසිකබල් සමාජවිද්‍යාඥයන් පිළිගන්නේ දැයි නො දනිමි. (ඇතැම් ප්‍රබුද්ධයන්ට අනුව දුටුගැමුණු රජතුමා ලාංකිකයෙක් වෙයි. ලාංකිකයා යන සංකල්පය නැතිකාලයක, ලාංකිකයන් නොසිටි කාලයක ලාංකික රජකු සිටියේ කෙසේ දැයි මේ පඬියන් පහදන්නේ නම් මැනවි.)  මේ සිංහල බෞද්ධ රජතුමා කතරගම දී දෙවියන්ට පුද පූජා පැවැත්වූයේ කෙසේ ද? ඒ රජතුමාගේ හින්දු බිසවකගේ දෙවි කෙනකු ද? ප්‍රබුද්ධයන් එයට දෙන පිළිතුර කුමක් ද?

මහසෙන් යනු අන් කිසිවකු නොව මෙරටට වෛදිකයන් පැමිණීමට පෙර සිටම මෙරට ජනතාවගෙන් පුද පූජා ලද දෙවි කෙනකු බව පැහැදිලි ය. මහසෙන් ඇතුළු එවකට මෙරට ජනතාවගෙන් පුද පූජා ලැබූ දෙවිවරු වෛදිකයන්ගේ පැමිණීමෙන් පසුව පමණක් නොව මිහිඳු මහරහතන් වහන්සේ විසින් සිංහල බුදුසසුන පිහිටුවනු ලැබීමෙන් පසුව ද මෙරට ජනයා විසින් අත්නොහරිනු ලැබූහ. ඒ දෙවිවරු සිංහල බුදු සසුනෙහි ආරම්භයෙහි සිටම සිටියහ. මේ මහසෙන් දෙවියන් යක්ෂයන්ගේ දෙවිකෙනකු වීමට ඇති ඉඩකඩ බොහෝ ය. පණ්ඩුකාභය රජු දවස සිංහල ජාතිය ඇතිවීමෙන් පසුව (ඔව් ධනපති ක්‍රමය ඇතිවීමට අවුරුදු දහස් ගණනකට පෙර) මහසෙන් සිංහලයන්ගේ දෙවිකෙනකු වන්නට ඇතැයි සිතිය හැකි ය. අද ඉන්නා කතරගම දෙවි මහසෙන් දෙවියන් හා තවත් දෙවිවරුන්ගේ එකතුවක් වෙයි.

© Prof. Nalin De Silva